# What did Jesus do (2) [13/10/2018]

## **යේසුස්වහන්සේ කළේ කුමක්ද?**

පසු ගිය සති කිහිපයක් අපි යේසුස්වහන්සේ ගැන කථා කළෙමු.
යේසුස්වහන්සේ කවුද? යේසුස්වහන්සේ මොනවාගේද?
ඒ සියල්ලම යේසුස්වහන්සේ ගැනය! සෑමදේම උන්වහන්සේ කරණකොට -ගෙන ආරම්භ වෙයි සහ උන්වහන්සේ කරණකොටගෙන අවසානවෙයි. උන්වහන්සේ සියල්ල එකට අල්ලා රඳවාගෙන සිටිනසේක. උන්වහන්සේව දැනගන්නා පිණිසත් අපගේ ජනසමාජයට උන්වහන්සේ ගැන දැන ගන්නට සැලැස්වීමටත් අප මෙහි සිටින්නෙමු.

යේසුස්වහන්සේ පැමිණියේ:

1. **සේවය කිරීමට -**
*මතෙව් 20:28 "එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්නට නොව සේවය කරන්ටය" යොහන් 13:1-7*
යේසුස්වහන්සේ ගෝලයන්ගේ පාද සෝදයි.

2. **බොහෝ දෙනෙක් උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දීමට -**
මතෙව් 20:28 *එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්නට නොව සේවය කරන්ටද බොහෝ දෙනෙක් උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආසේක.* (පැහැරගනු ලැබූ අය) මිලයක් ගෙවා නැවත මිලට ගැනීමටය. සාතන් මේ ලෝකයේ පාලකයා බව අපි දන්නෙමු. සාතන් විසින් වනාන්තරයේදී යේසුස්වහන්සේ පරීක්ෂා කරනු ලැබූ විට (ලූක් 4:5-7) ක්ෂණයකින් යේසුස්වහන්සේට ලෝකයේ රාජ්‍යයන් පෙන්නුවේය. 6 ඔහු ඒවායේ සියලුම බලය සහ තේජස යේසුස්වහන්සේට දෙන බව කීවේය. "එය මට දී තිබේ, මට ඕනෑ කෙනෙකුට එය දීමට මට පුළුවනි. 7 ඔබ මට නමස්කාර කළොත් එය ඔබට ලැබෙයි." සාතන් කවුද "බොරුවේ පියා" කියා යේසුස්වහන්සේ දැන සිටිසේක. සැබවින්ම නමස්කාර කළ යුතු සහ සේවය කළ යුතු කාටදැයි කියා යේසුස්වහන්සේ සාතන්ට මතක්කර දුන්සේක.

3. **ලෝකයා ගලවන්නට** - මක්නිසාද දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා ලෝකයට එවුවේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව, උන්වහන්සේ කරණකොටගෙන ලෝකයා ගලවන පිණිසය. යොහන් 3:17 සහ ලූක් 19:10 රෝම 5:19 බයිබලය අපට මෙසේ කියයි, එක මනුෂ්‍යයෙක් (ආදම්) වැරදි කර අප සියලුදෙනාම පාපය සහ මරණය සමග මේ කරදරයට දැමූ සේම, තව පුද්ගලයෙක් (යේසුස්වහන්සේ) හරි දේ කළ

බැවින් අප එයින් ඉවතට ගන්නා ලදී. ලූක් 24: 46-47

4. **දේව රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරන්නට -**

ලූක් 4:43 නමුත් උන්වහන්සේ: "මා විසින් අනික් නුවරවලත් දෙවියන්- වහන්සේගේ රාජ්‍යයේ යහපත් ශුභාරංචිය දේශනා කරන්නට ඕනෑය. මක්නිසාද ඒ පිණිස එවන ලද්දෙමි"යි ඔවුන්ට කීසේක. ඇදහිලිවන්තයින් ලෙස අපට ලැබී ඇති නියෝගය නම් ශුභාරංචිය දේශනා කිරීම සහ අනුන්ට යේසුස්වහන්සේව දැන ගන්නට සැලැස්වීමය.

**5. සත්‍යය උදෙසා සාක්ෂි දැරීමට** - "එසේනම් ඔබ රජෙක්!" පිලාත් කීවේය. යේසුස්වහන්සේ පිළිතුරු දෙමින් "මම රජෙක්යයි නුඹ කියනවා හරිය. ඒ පිණිස මම ඉපිද සිටිමි, මා ලෝකයට ඇවිත් සිටින්නේ සත්‍යයට සාක්ෂි දෙන පිණිසය. සත්‍යය පැත්තේ සිටින සියල්ලෝ මාගේ හඬ අසති." යොහන් 18:37

**6. ජීවනය දෙන්නට** - "සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශ කරන්ටත් පමණක්ය. මම ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය… මම ඔවුන්ට සදාකාල ජීවනය දෙමි; ඔව්හු කිසිකලකත් විනාශ නොවන්නෝය, කිසිවෙක් ඔවුන් මාගේ අතින් උදුරා

නොගන්නෝය. යොහන් 10:10,28

**7. වරදට සමාකිරීමට සහ අපගේ පාපය ඉවත් කරන්නට -** සිත් රිදවීමක හෝ කළ වරදක, වැරදි හරිගැස්වීමට හෝ ප්‍රකෘතිමත් කිරීමට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යවර්ගයා අතර සමගිකිරීම. ලෝකයේ පව් දුරු කරන බැටළු පැටවාණෝ ලෙස යොහන් බව්තීස්ත යේසුස්වහන්සේව හැඳින්වූයේය. හෙබ්‍රෙව් 2:17 *"එබැවින් සෙනගගේ පව් උදෙසා ශාන්තිකර පූජාවක් ඔප්පුකිරීමට දෙවියන්වහන්සේ පිළිබඳ කාරණා ගැන දයාවන්තවූ විශ්වාසවූ උත්තම පූජකයෙක් වෙන පිණිස සියලු දෙයින්ම තමන්ගේ සහෝදරයන්ට සමානවෙන්ට උන්වහන්සේට යුතුවූයේය."* 1 යොහන් 2:2 *උන්වහන්සේ අපගේ පාපවලට ගෙවීමක් ලෙස උන්වහන්සේගේ ජීවිතය දුන්සේක. උන්වහන්සේ අපේ පව් උදෙසා පමණක් නොව මුළු ලෝකයාගේම පාප උදෙසාත් ගෙවන ලදී. " පව් දුරුකරන පිණිස උන්වහන්සේ ප්‍රකාශකරනු ලැබූ බව නුඹලා දන්නහුය; කිසි පාපයක්ද උන්වහන්සේ තුළ නැත."* *1 යොහන් 3:5*

**8. අදහන්නන්ට නිදහස ප්‍රකාශකිරීමට -** *"ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය; මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්නට උන්වහන්සේ මා ආලේප කළසේක; (වහලුන්ට මිදීම) සිරකරුවන්ට නිදහස හා අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද උන්වහන්සේ මා එවූසේක."* ලූක් 4:18

ඉතාමත් පුදුම තවත් හාස්කම් යේසුස්වහන්සේ කළ සේක, ඒ සියල්ලම බයිබලයේ වාර්තාකර නැත. උන්වහන්සේ ලෝකයේ ගැලවුම්කරුවාණන්ය. යහපත් එඬේරාණෝය, දෙවියන්වහන්සේ අපට කොතරම් ප්‍රේම කරනවාද කීවොත්, අපි වරදට වැටුනත් අවුල් කරගත්තත් අපට බොහෝසේ ප්‍රේම කරන දෙවියන්වහන්සේ අපව අත් නොහරිනසේක. අපේ අවුලෙන් අපව මුදවා අපව මවා ඇති හේතුව කරා අපව ගෙන ඒම කළ හැකි එකමකෙනා යේසුස්වහන්සේ පමණයි. යේසුස්වහන්සේ තුළ අපට බලාපොරොත්තුවක් තිබේ. අප කළ යුතුවන්නේ අපගේ ජීවිතවලට යේසුස්වහන්සේ ස්වාමින්- වහන්සේ සහ ගැලවුම්කරුවාණන් ලෙස පිළිගැනීම, උන්වහන්සේ කල්වාරි කුරුසියේදී හෙළූ ලේ තුළින් උන්වහන්සේගේ සමාව සහ උන්වහන්සේ නොමිලේ දෙන ගැලවීම නමැති ත්‍යාගය ලබාගැනීමයි. යොහන් 1:12 *නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක. 13 ස්වාභාවිකව පැවතෙන ලෙස ලෙයෙන්වත් මාංශයෙන්වත් මනුෂ්‍යයාගේ කැමැත්ත ලෙසවත් නොව දෙවියන්වහන්සේගෙන් උපන්නෝය.*
අද ඔබට මේ යේසුස්වහන්සේ දැන හඳුනා ගතහැකියි. ඔබේ ජීවිතය නැවත පරණ ලෙසින්ම නොපවතිනු ඇත. ඔබේ ජීවිතයට උන්වහන්සේ පිළිගැනීමට කැමතිද?
ඔබේ අත ඔසවා ඒ බව පෙන්වන්න.
යාච්ඤාව: